# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2189/27 - 2020 අගෝස්තු මස 19 වැනි බදාදා - 2020.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DS/MG/LND/03/02/07.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/5/2014/HW/244.

මහජන අවශ්‍යතාවයක් සඳහා පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම් විස්තර* :-

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔයපළාත සුළු කෝරළයේ 22බී කරදගහමඩ ග්‍රාම නිලධාරි වසමේ කරදගහමඩ ගමේ පිහිටි බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙළ කරන ලද අවසාන ගම් සිතියම් 605 හා 2019.08.22 දිනැති මූලික පිඹුරේ අතිරේක අංක 02 පත්‍ර අංක 02හි දක්වා ඇති හෙක්ටයාර් 0.1917ක් වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

**1. කැබලි අංක 68**

ඉඩමේ නම: පිටකොටුවේ යාය; විස්තරය: ලඳු කැළෑ; මුල් හිමිකම් කියන අය: රත්නායක මුදියන්සේලාගේ කාංචනා කුමාරි, කරදගහමඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0850.

**2. කැබලි අංක 70**

ඉඩමේ නම: පිටකොටුවේ යාය; විස්තරය: ලඳු කැළෑ; මුල් හිමිකම් කියන අය: රත්නායක මුදියන්සේලාගේ කාංචනා කුමාරි, කරදගහමඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0805.

3. කැබලි අංක 72

ඉඩමේ නම: පිටකොටුවේ යාය; විස්තරය: ලඳු කැළෑ; මුල් හිමිකම් කියන අය: රත්නායක මුදියන්සේලාගේ කාංචනා කුමාරි, කරදගහමඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.262.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම එකී හිමිකම්, අයිතිවාසිකම් හෝ සම්බන්ධකම් ඉදිරිපත් කිරීම පිණිස තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලය පැවරුණු අයවලුන් 2020 ඔක්තෝබර් මස 12 වන දින ප.ව. 2.30ට මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2020 ඔක්තෝබර් මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එන්. පී. සමරවික්‍රම,
ප්‍රාදේශීය ලේකම්,
මීගහකිවුල

2020 අගෝස්තු මස 12 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 57


1A - G 32697 – 17 (2020/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*